# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 391/2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திக / Date — 06/03/2024 පැය 0550

## මාධ්‍ය නිවේදනය

**ටී 56 වර්ගයේ ගිනි අවියක්, එම ජීව පතොරොම් තොගයක් හා පතොරොම් ගැබ් 03 ක් සමඟ සැකකරුවෙකු හා සැකකාරියන් දෙදෙනෙකු අත්අඩංගුවට- කඳාන පොලිස් ස්ථානය.**

2024.03.02 වන දින කඳාන පොලිස් වසමේදී කඳාන පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් කිලෝග්‍රෑම් 11 ග්‍රෑම් 940 ක් බරැති කේරළ ගංජා තොගයක් සමඟ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට ගෙන රැඳවුම් නියෝග මත වැඩිදුර විමර්ශන සිදුකර ඇත.

සැකකරුවන්ගෙන් අනාවරණය වූ තොරතුරු අනුව ගෝනහේන පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරින්ගේ ද සහය ඇතිව 2024.03.05 වන දින සිදුකරන ලද වැටලීමකදී උස්වැටකෙයියාව ප්‍රදේශයේ නිවාස දෙකක සඟවා තිබූ **ටී 56 වර්ගයේ ගිනි අවියක්, මැගසින් දෙකක් හා ටී 56 ජීව පතොරොම් 20 ක් සමඟ කාන්තාවන් දෙදෙනෙකු** ද, කඳාන ප්‍රදේශයේ නිවසක සඟවා **තිබූ ටී 56 වර්ගයේ ජීව පතොරොම් 25 ක් සහිත මැගසින් 01 ක් සමඟ සැකකරුවෙකු** ද අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 20 ක් වන කඳාන ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වන අතර, සැකකාරියන් අවුරුදු 51 හා 57 ක් වයස්වල පසුවන උස්වැටකෙයියාව සහ කඳාන ප්‍රදේශවල පදිංචිකාරියන් වේ.**

අත්අඩංගුවට ගත් සැකකාරියන් දෙදෙනා දැනට විදෙස් ගතව සිටින සංවිධානාත්මක අපරාධ කල්ලි සාමාජිකයකුගේ මව සහ ඇයගේ නැගණිය බවට අනාවරණය වී ඇත. කඳාන පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**